# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 34 දරන අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අගෝස්තු මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2011 අංක 34 දරන අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 22 වන දින]

### අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ අනුරාධපුර පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක 34 දරන අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම, ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනමේ තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ සහ තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අනුරාධපුර පූජා භූමිය තුළ බෞද්ධ සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම ;

(ආ) අනුරාධපුර පූජා භූමිය තුළට පැමිණෙන බෞද්ධ පින්වතුන්ට නොමිලේ මල් ලබා දීමට කටයුතු සංවිධානය කිරීම ;

(ඇ) සෑම පසළොස්වක පොහෝ දිනයකම ආගන්තුක භික්ෂූන් වහන්සේට, උපාසක උපාසිකාවන්ට, දුගී මගී යාචකයන්ට දානය පිරිනැමීම හා සවස ගිලන්පස පූජා කිරීම ;

(ඈ) අනුරාධපුර පූජා භූමිය තුළ බෞද්ධ සැදැහැවතුන් උදෙසා ශීල, භාවනා පන්ති පැවැත්වීමට හා ධර්ම දේශනා පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම ;

(ඉ) විශේෂ උත්සව අවස්ථාවන්හි වන්දනාකරුවන්ගේ ගමන් මලු ආරක්ෂා කිරීමට කටයුතු සංවිධානය කිරීම හා ඔවුනට අවශ්‍ය පහසුකම් සැලසීම ;

(ඊ) බෞද්ධ ධර්මයේ උන්නතිය සඳහා ධර්ම පොත් සහ ධර්ම පත්‍රිකා ප්‍රසිද්ධ කිරීම හා බෞද්ධ පුස්තකාල සේවයක් ආරම්භ කිරීම ;

(උ) බෞද්ධ ස්වාමීන් වහන්සේට සහ දුප්පත් බෞද්ධ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉගෙනීමට උපකාර කිරීම හා ඔවුන්ට ශිෂ්‍යත්ව සංවිධානය කිරීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් බෞද්ධ ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ අතුරින්

කිසිවක් නංවාලීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) දේශීය හෝ විදේශීය කවර හෝ ප්‍රභවයකින් මුදලින් හෝ ද්‍රව්‍යයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට ;

(ඇ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක, යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීමට ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කල හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට සහ යම් බැංකුවක, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට හා ඒ ගිණුම් වසා දැමීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යනුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ඉටු කළ යුතු කරුණු පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීමට.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 8 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන ප්‍රධාන සභාපති, උප සභාපතිවරුන් හත් දෙනකු, ප්‍රධාන ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික හා විගණකවරයකු හා කාරක සභාවේ දහනව දෙනෙකුගෙන් සමන්විත වන සභාව විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ ධුර දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, නව සභාවක් තෝරා ගනු ලබන තෙක් ඔවුන් ධුර දැරිය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**6.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ සාමාජිකයකු වූ හා ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලබන තැනැත්තකුගේ නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වා ගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) නාමලේඛනයෙහි පහත සඳහන් විස්තර, එනම් :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ රක්ෂාව ;

(ආ) සාමාජිකයාගේ නම, නාමලේඛනයෙහි ඇතුළත් කරන ලද දිනය ; සහ

(ඇ) යම් සාමාජිකයකු, සාමාජිකයකු වීම අවසන් වූ දිනය

ඇතුළත් විය යුතු ය.

සාමාජිකත්වය අහෝසි වීම.

**7.** සාමාජිකත්වය අහෝසි වීම පහත සඳහන් එක් කරුණක් හේතු කොට ගෙන සිදු විය හැකි ය :—

(අ) සාමාජිකයා මිය යාම ;

(ආ) ඉල්ලා අස්වීම ;

(ඇ) සිහිවිකල් බවට පත්වීම ; සහ

(ඈ) යම් රීති කඩ කිරීම.

8. (1) සංස්ථාව විසින් එහි යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නිල කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සභාවේ රැස්වීමේ දී සහ ඒ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒවායේ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ පරිද්දෙන් එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු හා පදනමට අය විය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලු ම ණය සහ දායක මුදල් හා සම්මාදම් මුදල් මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

12. මිල දී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය තිබෙන අතර, ඒ සියලු දේපළ සංස්ථාවේ 8 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව උකස් කිරීමේ විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයට බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

13. සංස්ථාවේ මුද්‍රාව, ප්‍රධාන සභාපති, ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

14. සංස්ථාව විසුරුවා හරින ලද විටක සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.